පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව සබරගමුව - සති පාසල

තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය

සතිය-2 සතිය | ශ්‍රේණිය - 7 ශ්‍රේණිය | සැකසුම- මනෝජ් ලියන්වින්න

Department of Education, Sabaragamuwa Province/ Weekly School

## 5 පාඩම

## ක්‍රමලේඛ සංවර්ධනය

පෙළ පොතේ පිටු අංක 49,50,51 අධ්‍යයනය කර පිළිතුරු සපයන්න.

1. පහත සංකේත භාවිතා කර තේරීම (වරණය) හා පුනර්කරණය සඳහා වන ගැලීම් සටහන් ආකෘති ඇඳින්න.



2. පහත ගැලීම් සටහන් වල පාලන ව්‍යුහයන්, ආදානයන්, ප්‍රතිදානයන්, ක්‍රියාවලීන් හා තීරණ අවස්ථා වලට අදාල පද පහත වගුව තුල ලියන්න.

( ගැලීම් සටහන 1)




( ගැලීම් සටහන 2)



| | ගැලීම් සටහන 1 | ගැලීම් සටහන් 2 |
|---|---|---|
| පාලන ව්‍යුහය | | |
| ආදානය | | |
| ප්‍රතිදානය | | |
| ක්‍රියාවලිය | | |
| තීරණ අවස්ථාව | | |

3. පෙළ පොතේ පිටු අංක 50 ,51 හි තේරීම (වරණය) හා පුනර්කරණය ට අදාළව ඇඳ ඇති ගැලීම් සටහන් අධ්‍යයනය කර පහත සිදුවීම් නිරූපණය සඳහා ගැලීම් සටහන් අදින්න.

- සංඛ්‍යාවක් ලබා දුන් විට එය දෙකෙන් බෙදා ලැබෙන ශේෂය අනුව, එනම් ශේෂය = 0 නම් “ ඉරට්ටේ සංඛ්‍යාවක්” ලෙසද , ශේෂය = 1 නම් “ ඔත්තේ සංඛ්‍යාවක්” ලෙසද ප්‍රදර්ශනය කිරීම. (තේරීම)

- සම්මුඛ පරීක්ෂණයකින් සමත් වීමට උස 155cm ට වඩා වැඩි විය යුතුය. යමෙකුගේ උස ඇතුලත් කල විට එය 155cm ට වඩා වැඩි නම් “ සමත් ” ලෙසද එසේ නොවේ නම් “ අසමත් ” ලෙසද ප්‍රදර්ශනය කිරීම. (තේරීම)

- 1 සිට 6 දක්වා වූ දාදු කැටයක් භාවිතා කර සිදු කරන ක්‍රීඩාවකදී 6 අගය ලැබුන විට ජයග්‍රහණය හිමිවේ. 6 අගය ලැබෙන තෙක් දාදු කැටය උඩ දමා ලැබෙන අගය පරීක්ෂා කර බලයි. ජයග්‍රහණය කරන තෙක් මෙම ක්‍රියාව සිදු කෙරේ. (පුනර්කරණය)

- අවුරුදු උත්සවයක කණා මුට්ටිය බිඳීමේ තරගයේදී, තරගයට සහභාගී වන්නෙකු නිවරදි මුට්ටියට පහර දෙන තෙක් තරගය පැවැත්වේ. නිවරදි මුට්ටියට පහර නුදුන්නොත් ඊලග තරගකරුට අවස්ථාව හිමිවේ. නිවරදි මුට්ටියට පහර දීමෙන් ජයග්‍රහණය හිමිවී තරගය අවසන් වේ. (පුනර්කරණය)